# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2315/66 - 2023 ජනවාරි මස 21 වැනි සෙනසුරාදා - 2023.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාත් ආණ්ඩුකාරවර නිවේදන

වයඹ පළාතේ ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 326 (1) වගන්තිය යටතේ කරනු ලබන නියමයයි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට්
**වසන්ත කරන්නාගොඩ,**
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2023 ජනවාරි මස 21 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**නියමය**

වයඹ පළාතට අයත් කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් 2023 වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය මගින් සංශෝධිත 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 215(අ) වගන්තිය ප්‍රකාරව සභාවේ සම්මත කරනු නොලැබීම හා/හෝ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර වන ම විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2199/15 දරන සහ 2020.10.29 දිනැති වූ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද 2020 මහා නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ නියෝග ප්‍රකාරව අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022.12.31 වැනි දින සිට කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයා වන තුෂාර සංජීව විතාරණ යන අය ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු අතර, ඒ දින සිට බල පැවැත්වෙන පරිදි කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපති ධූරය පුරප්පාඩු වූවා සේ සැලකිය යුතු බව මෙයින් නියම කරමි.

EOG 01-0214/1


1A - PG 6180 — 07 (2023/01)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාත් ආණ්ඩුකාරවර නිවේදන

වයඹ පළාතේ ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 326 (1) වගන්තිය යටතේ කරනු ලබන නියමයයි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට්
**වසන්ත කරන්නාගොඩ,**
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2023 ජනවාරි මස 21 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**නියමය**

වයඹ පළාතට අයත් කුරුණෑගල මහා නගර සභාවේ 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය මඟින් සංශෝධිත 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 215(අ) වගන්තිය ප්‍රකාරව සභාවේ සම්මත කරනු නොලැබීම හා/හෝ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර වන ම විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2199/15 දරන සහ 2020.10.29 දිනැති වූ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද 2020 මහා නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ නියෝග ප්‍රකාරව අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපති ධූරය 2022.12.31 දින සිට පුරප්පාඩු වී ඇති බැවින් 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන) පනතට අනුව එම පුරප්පාඩුව පිරවෙන තෙක් නගරාධිපතිවරයාගේ ධූරය පුරප්පාඩු වූ දින සිට එම තනතුරේ බලතල, කටයුතු, කාර්යය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 14 (6) වගන්තිය ප්‍රකාරව නියෝජ්‍ය නගරාධිපතිවරයා වෙත පැවරෙන බව මෙයින් නියම කරමි.

EOG 01-0214/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.